**විසර්ජන ශිර්ෂය - 174 පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව -2010 වර්ෂය.**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

I කොටස - අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වු දෙපාර්තමේන්තුවල ගිණම් පිළබඳ සම්පිණ්ඩන වාර්තාව
II කොටස - එක් එක් විසර්ජන ශිර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

**1 කොටස**

**පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පළබඳ සම්පිණ්ඩන වාර්තාව**

1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| වැය ශිර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව |
| 326 | ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව |

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

මුළු ප්‍රතිපාදනය හා වියදම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු දෙකක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.4,444,339,224 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.4,416,425,969 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.7,969,504 ත් රු.11,443,738 ත් අතර පරාසයක ප්‍රමාණයන්ගෙන් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් සියයට 1.09 ත් අතර පරාසයක පැවතුනි.විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශිර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මුලධන | පුනරාවර්තන | මුලධන | පුනරාවර්තන | මුලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 174 | පුනරුතථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 261,560,000 | 781,029,224 | 257,424,069 | 773,721,417 | 4,135,931 | 7,307,807 |
| 232 | බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 3,136,300,000 | 193,100,000 | 3,132,019,693 | 188,880,294 | 4,280,307 | 4,219,706 |
| 326 | ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 54,400,000 | 17,950,000 | 53,852,266 | 10,528,230 | 547,734 | 7,421,770 |
| | එකතුව | 3,452,260,000 | 992,079,224 | 3,443,296,028 | 973,129,941 | 8,963,972 | 18,949,283 |

## 2.2 අත්තිකාරම් ගිණුම්

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්.**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු දෙකක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළපැද තිබුණි.විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 17401 | 1,000,000 | 991,673 | 350,000 | 1,470,513 | 10,000,000 | 6,666,555 |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 23201 | 155,000,000 | 133,031,457 | 95,000,000 | 101,140,186 | 406,000,000 | 326,060,942 |
| ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 32601 | 3,000,000 | 2,931,000 | 1,800,000 | 1,861,682 | 13,000,000 | 15,535,208 |

### 2.2.2 වාණිජ අත්තිකාරම් ගිණුම්

අමාත්‍යාංශය යටතේ වූ බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් වාණජ අත්තිකාරම් ගිණුමක් පවත්වා ගෙන ගොස් තිබුණි.

(අ) **පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්.**

වාණජ අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු පහත සඳහන් සීමාවන් පිළිපැද තිබුණි.

| දෙපාර්තමේන්තුව | විෂය අංකය | වියදම | | ලැබීම | | හර ශේෂය | | බැර ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 23202. | 153,000,000 | 121,765,174 | 175,000,000 | 113,116,394 | 35,000,000 | 59,481,687 | 15,000,000 | 4,590,506 |

(ආ) <u>මූල්‍ය ප්‍රතිඵල</u>

වාණිජ අත්තිකාරම් ගිණුමේ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි විය.

<u>මූල්‍ය ප්‍රතිඵල</u>

| විෂය අංකය | අත්තිකාරම් ගිණුම් කටයුත්ත | 2010 | | 2009 | |
|---|---|---|---|---|---|
| | | ලාභය (කල්පිත ගාස්තු රහිතව) | ලාභය (කල්පිත ගාස්තු සහිතව) | ලාභය (කල්පිත ගාස්තු රහිතව) | ලාභය (කල්පිත ගාස්තු සහිතව) |
| | | රු. | රු. | රු. | රු. |
| 23202 | කාර්මික හා කෘෂිකාර්මික | 39,666,949 | 15,687,296 | 46,661,964 | 25,110,670 |

## 2.3 <u>අග්‍රිම හා පොදු තැන්පත් ගිණුම්</u>

### 2.3.1 <u>අග්‍රිම ගිණුම්</u>

අමාත්‍යාංශයෙ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු දෙකක 2010 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම් වල රු.1,843,983 ක් වූ හර ශේෂ හා රු.254,521 ක් වූ බැර ශේෂ තිබුණි.විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය හර / (බැර) |
|---|---|
| | රු. |
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 1,843,983 |
| ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | (254,521) |

### 2.3.2 <u>පොදු තැන්පත් ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේනතු දෙකක පොදු තැන්පත් ගිණුම් වල ශේෂවල එකතුව රු.58,253,359 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ගණුම් අංකය | 2010 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| පුනරුතථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 174 | 748,576 |
| ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව | 326 | 5,901,703 |

| | | |
|---|---|---|
| බන්ධනාගාර දෙපාර්තමේන්තුව | 232 | 51,603,080 |

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ රු.51,603,080 ක් වූ පොදු තැන්පත් ශේෂය පිළිබඳව කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි.

## 11 කොටස

## එක් එක් විසර්ජන ශිර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

1. **විසර්ජන ශිර්ෂය 174 - පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය.**

**විගණන විෂය පථය.**

පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා වු මුල්‍ය වාර්තා, සැසදුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී.ගිණුම් හා සැසදුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සදහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **ගිණුම් හා සැසදුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම.**

විසර්ජන ගිණුම් හා සැසදුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකුලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යාන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

1.3 **ගිණුම් හා සැසදුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය**

2010 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසදුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ආ) දක්වා වු පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.5 දක්වා ඡේදවල සදහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් මුදල් රෙගුලාසි 110 විධිවිධාන ප්‍රකාරව හානි පිළිබඳ ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ආ) <u>අයවැය විචලනය</u>

වැය විෂයයන් 2 ක් සදහා සලසා තිබුණු රු.350,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

## 1.4 අනුකූල නොවීම්.

නියැදි විගණන පරීක්ෂණ වලින් නිරීක්ෂණය වූ නීතිරීති රෙගුලාසි වල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

මු.රෙ. 371(2)(ඇ) විධිවිධාන ප්‍රකාරව ලබා දුන් අත්තිකාරම් අදාල කාර්යය නිමකල වහාම පියවිය යුතු වුවත් අවස්ථා 27 ක දී ලබාගත් රු.620,523 ක් වූ අත්තිකාරම් පියවීමේදී දින 15 සිට දින 138ක කාලපරාසයක ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

## 1.5 මානව සම්පත් කළමනාකරණය

<u>අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යා.</u>

2010 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 12 | - | 01 |
| (ii) | තෘතියික මට්ටම | 02 | 02 | - | - |
| (iii) | ද්විතියක මට්ටම | 20 | 19 | 01 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 19 | 17 | 02 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 05 | | 05 |
| | එකතුව | 52 | 55 | 03 | 06 |

බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2. **විසර්ජන ශීර්ෂය 232 - බන්ධනාගාර දෙපාර්තමේන්තුව.**

**විගණන විෂය පථය.**

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී.ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත්

කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

2.2. **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම.**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුකම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිළධාරීගේ හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

2.3 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය**

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඊ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ 2.4 සිට 2.6 දක්වා වූ ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ලේඛණ හා පොත්පත් පවත්වා නොතිබීම.**

(i) දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලිනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| ලේඛණ වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛණය | මු.රෙ 502(2) | ස්ථාවර වත්කම් ලේඛණයක් |

| | | |
|---|---|---|
| | | පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| හානි හා පාඩු ලේඛණ | මු.රෙ 110 හා 103(1)(ඉ) | නියමිත ආකෘතියේ ලේඛණ පවත්වාගෙන නොතිබුණි. |

(ii) දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදි ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට සහ ඉකුත් වර්ෂවලදී නිකුත් කළ විගණන විමසුම් 02 කට 2011 මාර්තු 31 දින වන විට ද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.1,453,567 ක් විය.

(ආ) <u>අයවැය විචලනය</u>

වැය විෂයයන් 3 ක් සදහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.1,182,787 සිට රු.1,959,225 ක පරාසයක පැවති අතර එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් 12% ත් 63 % අතර පරාසයක විය.

(ඇ) <u>පොදු තැන්පත් ගිණුම.</u>

වර්ෂ 2 ක් ඉක්ම වූ රු.54,175,327 ක් වූ තැන්පත් ශේෂ 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) <u>රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය.</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) විෂය අංක 23201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2010 දෙසැම්බර් 31 දින සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.324,972,459 ක්වූ අතර, එම හිඟ ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ii) දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව ණය හා අත්තිකාරම් ශේෂ දැක්වෙන කේවල ගිණුම් ශේෂ ලේඛනය පිලියෙල කර නොතිබුණි.

(ඉ) <u>වානිජ අත්තිකාරම් ගිණුම්</u>

පහත සඳහන් නරීක්ෂණයන් කරණු ලැබේ.

(ii) විෂය අංක 23202 දරන බන්ධනාගාර කෘෂිකාර්මික හා කාර්මික කටයුතු අත්තිකාරම් ගිණුමේ අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.83,168,629 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(iii) 2010 වර්ෂයේ ගිණුම් හා ගනුදෙනු පරීක්ෂාවේදී අනාවරණය වූ ප්‍රධාන විගණන නිරීක්ෂණ.

- අවසන් ගිණුම් වල සඳහන් විකුණුම් වටිනාකම් හා බන්ධනාගාර ආයතන 08 ක් විසින් පිළියෙල කර ඉදිරිපත් කරන ලද ගිණුම් වල සඳහන් විකුණුම් වටිනාකම අතර රු.225,809 ක වෙනසක් නිරීක්ෂණය විය.
- අවසන් ගිණුම් ප්‍රකාශවල අමුද්‍රව්‍ය මිලට ගැනීම් රු.2,094,785 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(i) 2010 වර්ෂයේ ගිණුම් වල ඇතුළත් තොගය පහත සඳහන් දෝෂයන් නිර්ණය විය.

- වර්ෂ අවසාන තොග අගය රු.200,156ක් අඩුවෙන් දක්වා තිබුණි.
- පල්ලෙකැලේ බන්ධනාගාරයේ රු.60,000 ක් වූ අවසන් තොගය භෞතිකව ගණනය කර නොතිබුණි.
- කුරුවිට බන්ධනාගාරයේ සත්ව පාලන අංශයේ තොගයේ රු.58,125 ක වෙනසක් නිරීක්ෂණය විය.
- බන්ධනාගාර 05 කට අදාල පසුගිය වර්ෂවල සිදුවී ඇති අලාභයන් සමාලෝචිත වර්ෂයේ ලාභ අලාභ ගිණුමට ගැලපුම් කර තිබුණි.

(ඊ) <u>බේරුම් නොකළ බැරකම්.</u>

දෙපාර්තමේන්තුව විසින් 2010 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.520,320,899 ක් වු අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි.

2.4. <u>අනුකූල නොවීම්.</u>

<u>නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම</u>

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති, රෙගලාසි හා කළමානාකරණ තීරණයන්ට යොමුව. | වටිනාකම<br>රු. | අනුකුල නොවීම |
|---|---|---|
| <u>චක්‍රලේඛ විධිවිධාන</u> | | |
| 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | | දෙපාර්තමේන්තුවට අයත් සංචිත වාහන සඳහා රාජ්‍ය ලාංජනය යොදා ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| 1999 ඔක්තෝබර් 08 දිනැත අංක 22/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය. | 1,151,195 | නිල වාහන හිමි කම් නොමැති නිලධාරීන් දෙදෙනෙකු සඳහා නිල වාහන ලබාදී තිබූ අතර 2010 ජනවාරි සිට 2011 අගෝස්තු මාසය දක්වා ඉන්ධන වෙනුවෙන් රු.1,151,195 ක් වැය කර තිබුණි. |

## 2.5. <u>බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්.</u>

බැංකු ගිණුම් එකකට අදාල 2010 ජුලි මස බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියල කිරීමේදී 2011 මාර්තු දක්වා වූ දීර්ඝ ප්‍රමාදයන් දක්නට ලැබුණි.

## 2.6. <u>මානව සම්පත් කළමනාකරණය</u>

<u>අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව.</u>

2010 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 57 | 38 | 19 | - |
| (ii) | තෘතියික මට්ටම | 5650 | 4406 | 1244 | - |
| (iii) | ද්විතියක මට්ටම | 402 | 225 | 177 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 252 | 139 | 113 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 05 | | 05 |
| | එකතුව | 6361 | 4813 | 1553 | 05 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 1553 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. විසර්ජන ශිර්ෂය 326 - ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුව.

විගණන විෂය පථය.

ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී.ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

3.2. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම.

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

3.3 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණය

2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ප්‍රජාපාදක විශෝධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.5 දක්වා ඡේදවල සඳහන් වෙනත් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

වැය විෂයය 326 - 1 - 1 - 2003 යටතේ සලසා තිබුණු රු.200,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

3.4. වත්කම් කළමනාකරණය

බේරුම් නොකළ බැරකම්

දෙපාර්තමේන්තුව විසින් 2010 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.5,894,985 ක් වු අතර, ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි.

3.5. මානව සම්පත් කළමනාකරණය.
අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව.

2010 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 02 | 01 | - |
| (ii) | තෘතික මට්ටම | 125 | 99 | 26 | - |
| (iii) | ද්විතික මට්ටම | 85 | 64 | 21 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 21 | 14 | 07 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 24 | | 24 |
| | එකතුව | 234 | 203 | 55 | 24 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

i. සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 55 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

ii. බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.